12963

AL/2021(2022)/51/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

**51 S I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

විභාග අංකය : ....................................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

**I කොටස**

- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **තිත් ඉර මත** ලියන්න.

**II කොටස**

- අනුකොටස් **තුනකින්** සමන්විත ය.
  **'අ'** කොටසින් ප්‍රශ්න දෙකක් හා **'ආ'** සහ **'ඉ'** යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

* **I** කොටසට හා **II** කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

| පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණයි. | |
|---|---|
| **I පත්‍රය සඳහා** | |
| **කොටස** | **ලකුණු** |
| I | |
| II | |
| **එකතුව** | |
| 1 වැනි පරීක්ෂක | 2 වැනි පරීක්ෂක |

tamilguru.lk

## I කොටස

- ප්‍රශ්න අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** තෝරන්න.

**1.** 'සංඛනිධි' හා 'පද්මනිධි' රූ සහිත මුරගල් යුගල දක්නට ලැබෙන ස්ථානය වන්නේ,
(1) ථූපාරාම ස්තූපයයි.
(2) ලංකාරාම ස්තූපයයි.
(3) අභයගිරි ස්තූපයයි.
(4) මැදිරිගිරිය වටදාගෙයයි.
(5) ලංකාතිලක පිළිමගෙයයි. (.........)

**2.** ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ කලා කෘති අතර ස්වභාවිකත්වයට සමීප රුවක් වන්නේ,
(1) ශිව පශුපති ය.
(2) කවන්ධ රූපය ය.
(3) නළඟන රුව ය.
(4) තාපස රුව ය.
(5) මාතෘ දෙවඟන ය. (.........)


**3.** දඹුල්ල ලෙන් විහාරය,
(1) මහනුවර යුගයට අයත් බිතු සිතුවම් විශාල සංඛ්‍යාවක් ඇති ස්ථානයකි.
(2) කඩොල්ගල්ලෙ සිත්තර පරම්පරාවේ ශිල්පීන් විසින් කළ සිතුවම් සහිත ස්ථානයකි.
(3) අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා වූ සිතුවමින් අලංකාර වූවකි.
(4) නීලගම සිත්තර පරපුර විසින් අඳින ලද බිතු සිතුවම් දක්නට ඇති ස්ථානයකි.
(5) ජාතක කථා විශාල සංඛ්‍යාවක් සිතුවමට නගා ඇති ස්ථානයකි. (.........)


[දෙවැනි පිටුව බලන්න.

**4.** ඊජිප්තුවේ නව රාජධානි යුගයේ දී,
(1) පිරමීඩ වෙනුවට දේවස්ථාන ඉදිකිරීමට පෙළඹී තිබේ.
(2) නයිල් මිටියාවතෙහි බොහෝ පිරමීඩ ඉදිකෙරිණ.
(3) ප්‍රමාණයෙන් විශාල පිරමීඩ ගණනාවක් ඉදිවී තිබේ.
(4) පාරාවෝවරුන්ගේ ලෞකික දිවිය උදෙසා මාළිගා ඉදි විය.
(5) විශාල පිරමීඩ වෙනුවට කුඩා ප්‍රමාණයේ ඒවා ඉදිකෙරිණ. (.........)


**5.** ග්‍රීක සම්භාව්‍ය යුගයට අයත් මූර්තියක් වන්නේ,
(1) වීනස් ඩි මේලෝ ය.
(2) ලැවොකූන් ය.
(3) විජයග්‍රහණයේ දෙවඟන ය.
(4) මියැදෙන ගෝල්වරයා ය.
(5) හර්මීස් හා ඩයොනිසස් ය. (.........)

- ප්‍රශ්න අංක **6** සිට **10** තෙක් අසා ඇති ප්‍රශ්නවලට **වඩාත් ගැළපෙන පිළිතුර 1** සිට **7** තෙක් අංක කර ඇති පහත සඳහන් වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් තෝරන්න.



1



2


3


4


5


6


7

**6.** බෞද්ධාගමික ඉදිකිරීම් ලෙස සැලකිය හැක්කේ,
(1) **1, 2, 5** (2) **1, 3, 4** (3) **2, 4, 5** (4) **3, 5, 7** (5) **4, 5, 7** (.........)

**7.** මේවා අතරින් ඉන්දියාවේ පිහිටි ඉදිකිරීම් වනුයේ,
(1) **1, 4** (2) **4, 5** (3) **4, 6** (4) **4, 7** (5) **6, 7** (.........)

**8.** ඉන්දීය කලා ලක්ෂණ මැනවින් දිස්වන ඉදිකිරීම් වනුයේ,
(1) **1, 2, 5, 6** (2) **1, 4, 5, 7** (3) **1, 5, 6, 7** (4) **2, 3, 4, 5** (5) **2, 3, 5, 7** (.........)

**9.** ආගමික **නොවන** ඉදිකිරීම් ලෙස දැක්විය හැක්කේ,
(1) **2, 3, 6** (2) **3, 4, 5** (3) **3, 4, 6** (4) **3, 6, 7** (5) **4, 6, 7** (.........)

**10.** පොළොන්නරු යුගයට අයත් ඉදිකිරීම් වනුයේ,
(1) **1, 2, 6** (2) **1, 5, 6** (3) **1, 6, 7** (4) **2, 3, 5** (5) **4, 5, 6** (.........)

[තුන්වැනි පිටුව බලන්න.

● ප්‍රශ්න අංක **11** සිට **15** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන පිළිතුර A, B, C, D, E** ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.



A




B



C



D



E

**11.** **A** අක්ෂරයෙන් දැක්වෙන 'ඉන්ද්‍රානි' නමැති චිත්‍රය,
(1) මුදලිඳු අමරසේකරගේ ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී නිර්මාණයකි.
(2) ස්ටැන්ලි අබේසිංහගේ නූතනවාදී කාන්තා ආලේඛ්‍යයකි.
(3) හැරී පීරිස්ගේ ප්‍රකාශනවාදී ලක්ෂණ සහිත ආලේඛ්‍ය සිතුවමකි.
(4) අයිවන් පීරිස්ගේ නූතනවාදී කාන්තා රූපයකි.
(5) ජේ.ඩී.ඒ. පෙරේරාගේ ස්වභාවිකවාදී කෘතියකි. (.........)

**12.** **B** අක්ෂරයෙන් දැක්වෙන රාජා රවි වර්මාගේ 'සරස්වතී' නම් වූ සිතුවමින්,
(1) යුරෝපීය නූතන කලාවේ ශිල්පක්‍රම ඇසුරින්, ඉන්දීය වස්තු විෂයයක් නිරූපිත ය.
(2) ඇන්ග්ලෝ-ඉන්දියානු සම්ප්‍රදාය අතික්‍රමණය කරමින්, දේව භක්තිය නිරූපණය වේ.
(3) යුරෝපීය අධියථාර්ථවාදී ශිල්පක්‍රම අනුව, හින්දු දේව කථාවක එන චරිතයක් නිරූපිත ය.
(4) යුරෝපීය නූතනවාදී කලා ලක්ෂණ සහිතව, ඉන්දීය පුරාණෝක්තියක් නිරූපිත ය.
(5) යුරෝපීය ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලා ලක්ෂණ අනුව ඇඳි හින්දු දේවතා රුවක් නිරූපණය වේ. (.........)

**13.** **C** අක්ෂරයෙන් දැක්වෙන එල්.ටී.පී. මංජු ශ්‍රී විසින් අඳින ලද සිතුවම,
(1) දිය සායම් මාධ්‍යයෙන්, කාන්තා සිරුරේ රිද්මය ස්වභාවිකව නිරූපණයට ගත් උත්සාහයකි.
(2) ශෛලිගත ලක්ෂණ අතිශයෝක්තියෙන් නිරූපණය වන සේ අඳින ලද්දකි.
(3) නූතන යුරෝපීය කලාවේ ප්‍රයෝගයන්හි සහ පෙරදිග ශෛලිගත ලක්ෂණයන්හි සම්මිශ්‍රණයකි.
(4) ශාස්ත්‍රාලීය යථාර්ථවාදී කලාවේ ලක්ෂණ පිළිබිඹු කරන්නකි.
(5) තෙල් සායම් භාවිතයෙන්, නව උපස්ථිතිවාදී ශිල්ප ක්‍රම අනුව අඳින ලද්දකි. (.........)

**14.** **D** අක්ෂරයෙන් දැක්වෙන 'කැඩපත අසල සිටින ගැහැනිය' නම් වූ සිතුවම,
(1) සාම්ප්‍රදායික චිත්‍ර ශෛලියක් එලෙසින්ම අනුගමනය කිරීමකි.
(2) සංකේතාත්මකව ඉදිරිපත් කළ දෘශ්‍ය ප්‍රකාශනයකි.
(3) ප්‍රකෘති ස්වභාවය කලාත්මක ප්‍රකාශනයක් බවට පරිවර්තනය කිරීමකි.
(4) අර්ධ වියුක්තකරණයක් සහිතව නිරූපිත කාන්තා රූපයකි.
(5) ශෛලිගත ආකාරයෙන් කාන්තා රුව සිතුවම් කිරීමකි. (.........)

**15.** **E** අක්ෂරයෙන් දැක්වෙන මොන්ඩ්‍රියන්ගේ සිතුවම,
(1) තිරස් හා සිරස් රේඛාවන්ගෙන් ගොඩනැගෙන හැඩතල සම්මිශ්‍රණය කිරීමකි.
(2) ගැටුමක් මෙන්ම සුසංයෝගයක් ද මතුවන පරිදි විවිධ වර්ණ චතුරස්‍ර ස්ථානගත කිරීමකි.
(3) රේඛා, වර්ණ, අවකාශ භාවිතයෙන් වර්ණයන්ගේ ගැඹුර ප්‍රකාශ කිරීමකි.
(4) චතුරස්‍රාකාර ආකෘති මගින් ගොඩනැගූ පරිකල්පිත සංරචනයකි.
(5) සරල රේඛා හා චතුරස්‍ර හැඩ මගින් කැන්වසය මත ගොඩනැගූ සංරචනයකි. (.........)

More Past Papers at
tamilguru.lk

[හතරවැනි පිටුව බලන්න.

● ප්‍රශ්න අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයට **වඩාත් යෝග්‍ය වරණය** පහත සඳහන් **F, G, H, I, J** ලෙස නම් කර ඇති කැටයම් ඡායාරූප ඇසුරෙන් තෝරන්න.


F


G


H


I


J

**16.** **F** අක්ෂරයෙන් දැක්වෙන මෙම කැටයම,
(1) පිරිමි රුවේ ප්‍රබෝධයත්, කාන්තා රුවේ ශෝකයත් දැක්වීමට ගත් උත්සාහයකි.
(2) තෙළිමේ ශිල්ප ක්‍රමය උපයෝගී කොට ගනිමින් කළ දිව්‍යමය ප්‍රකාශනයකි.
(3) රාජකීයත්වය නිරූපණය වන අයුරින් කළ, පල්ලව කලා ලක්ෂණ සහිත එලකයකි.
(4) ගුප්ත කලා ලක්ෂණ සහිත භාවපූර්ණ හා ලාලිත්‍යමය ප්‍රකාශනයකි.
(5) මානව රූ දෙකක් එක්කොට කරන ලද ශෘංගාරාත්මක සංරචනයකි. (.........)

**17.** **G** අක්ෂරයෙන් දැක්වෙන දැවමය පනේල කැටයම,
(1) ඇම්බැක්ක දේවාලයේ ඇති, මව් සෙනෙහස ප්‍රකාශිත කැටයමකි.
(2) පනාවිටිය අම්බලමේ දක්නට ඇති, සාමාන්‍ය ජන ජීවිතය නිරූපිත අවස්ථාවකි.
(3) මහනුවර මගුල් මඩුවේ ඇති, රාජකීය පවුලක් දැක්වෙන කැටයමකි.
(4) ඇම්බැක්ක දේවාලයේ දක්නට ඇති, දේව කතාවක් වස්තු විෂය කොටගත් අවස්ථාවකි.
(5) පනාවිටිය අම්බලමෙහි ඇති, ප්‍රභූ කාන්තාවක් සහ පරිවාර ස්ත්‍රියක් දැක්වෙන කැටයමකි. (.........)


**18.** **H** අක්ෂරයෙන් දැක්වෙන භාරුත් නටඹුන් අතරින් හමු වී ඇති කැටයම,
(1) සිදුවීම් කිහිපයක් එකම පනේලයක අල්ප උන්නතව සංරචනය කළ අවස්ථාවකි.
(2) ජාතක කථාවක් වස්තු විෂය කරගත් අර්ධ උන්නත පනේලයකි.
(3) බුද්ධ චරිතය හා සම්බන්ධ ප්‍රකට සිද්ධියක් මුල්කොට ගත්තකි.
(4) ගල්වැටෙහි අලංකරණ අංගයක් ලෙස කැටයම් කළ සමකාලීන සිදුවීමකි.
(5) අඛණ්ඩ කථන ශෛලියෙන් නිර්මිත අල්ප උන්නත පුවරු කැටයමකි. (.........)

**19.** **I** අක්ෂරයෙන් දැක්වෙන කැටයම,
(1) බුද්ධ චරිතය හා සම්බන්ධ පුරාවෘත්තයක් නිරූපණය වන්නකි.
(2) සිදුහත් කුමරු උයන්කෙළි සඳහා යන අවස්ථාව සංකේතවත් කරන්නකි.
(3) අමරාවතී ප්‍රදේශයෙන් හමුවූ රාජකීය පෙරහැරක් දක්වන්නකි.
(4) සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය නිරූපණය වන්නකි.
(5) යුධබිමට යන අශ්වාරෝහකයෙකු නිරූපණය වන්නකි. (.........)

**20.** **J** අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) මෙන්කුරේ රජු සතුරන් සමග යුද වදින අයුරු දැක්වෙන කැටයමකි.
(2) පාරාවරුන්ගේ සටන් දර්ශන ඇතුළත් පාෂාණමය එලකයකි.
(3) හොරස් දෙවියන් සමග කෙරෙන සටන් දර්ශන ඇතුළත් කැටයමකි.
(4) කාෆ්රේ රජුගේ ජීවිත තොරතුරු ඇතුළත් කැටයම් පුවරුවකි.
(5) නාමර් රජුගේ යුද ජයග්‍රහණ සංකේතාත්මකව දැක්වෙන කැටයම් එලකයකි. (.........)

[පස්වැනි පිටුව බලන්න.

● ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් ඇති එක් එක් ප්‍රකාශයට **වඩාත් ගැළපෙන වරණය** පහත සඳහන් **K, L, M, N, O** යනුවෙන් නම් කර ඇති කලා කෘති ඇසුරෙන් තෝරන්න.


K


L


M


N


O

**21.** **K** අක්ෂරයෙන් දැක්වෙන ගල් විහාරයේ සමාධි බුදු පිළිමය,
(1) පල්ලව ආභාසය මත නිම කෙරුණකි.
(2) මහායාන සංකල්පයක් අනුව නෙලන ලද්දකි.
(3) අමරාවතී ශෛලියෙන් කරන ලද්දකි.
(4) මථුරා කලා සම්ප්‍රදාය මත නිමවූවකි.
(5) ගුප්ත ආභාසයෙන් යුතුව නිම කෙරුණකි. (.........)

**22.** **L** අක්ෂරයෙන් දැක්වෙන අර්ධනාරී පිළිරුව,
(1) පොළොන්නරු යුගයෙන් හමුවූ ලෝහ වාත්තු පිළිමයකි.
(2) වම් අර්ධය කාන්තා ස්වරූපයෙන් නිමවා ඇති පිළිමයකි.
(3) ස්ත්‍රී ශරීරයේ සුන්දරත්වය ප්‍රකාශ කෙරෙන මූර්තියකි.
(4) 'ස්ත්‍රිය පුරුෂයාට වඩා බලවත් ය' යන්න නිරූපිත කෘතියකි.
(5) අභයගිරි විහාර භූමියෙන් හමුවූ ලෝකඩ පිළිමයකි. (.........)

**23.** **M** අක්ෂරයෙන් දැක්වෙන ගන්ධාරයෙන් හමුවූ බ්‍රෙගම් පිළිමය,
(1) යමක ප්‍රාතිහාර්ය නිරූපිත පිළිමයක් සේ පිළිගැනේ.
(2) මනා නිමාවකින් සහ රැළි සහිත චීවරයකින් සමන්විත වේ.
(3) අභය මුද්‍රාව නිරූපණය වන බුදු පිළිමයක් සේ සැලකේ.
(4) ඉන්දියානු කලා ලක්ෂණ පෙන්නුම් කෙරෙන බැව් පිළිගැනේ.
(5) නිවැරදි පරිමාණයට අනුව නිම කළ පිළිමයකි. (.........)

**24.** **N** අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය,
(1) චෝල සම්ප්‍රදායට අයත් දේවාලයක පිටත බිත්තියෙහි ඇති ශිව භික්ෂාටන රූපයකි.
(2) නුග ගසක් යට රාජලීලාසනයෙන් සිටින කල්‍යාණ සුන්දර මූර්තියකි.
(3) රාජ රාජේශ්වර දේවාලයේ වම්පස කුටියක කැටයම් කර ඇති ශිව දේව රූපයකි.
(4) සියලු දැනුම්වල ගුරුවරයාගේ වේශයෙන් පෙනී සිටින ශිව දක්ෂිණ මූර්ති රූපයකි.
(5) ශෛලීගත ආකාරයෙන් නෙළා ඇති, විෂ්ණු දේව රූපයකින් සමන්විත ගෝපුර කැටයමකි. (.........)

**25.** **O** අක්ෂරයෙන් දැක්වෙන 'චින්තකයා' මූර්තියෙන් රොඩෑන් උත්සාහ කර ඇත්තේ,
(1) මිනිස් සිරුරේ හැඩි දැඩි බව සුමට ලෙස මූර්තිමත් කිරීමටයි.
(2) භාව ප්‍රකාශනය සඳහා පරිපූර්ණ නිමාවකින් යුතු මානව රූපයක අවශ්‍යතාව දැක්වීමටයි.
(3) අසම්පූර්ණ නිමාව පවා කලාත්මක මූලධර්මයක් බව තහවුරු කිරීමටයි.
(4) කලකිරීම නිසා ඇති වූ අපේක්ෂා භංගත්වය හැඩි දැඩි ශරීර ලක්ෂණ සහිතව පෙන්වීමටයි.
(5) ගැඹුරු භාව ප්‍රකාශනයක් සඳහා නග්න මිනිස් ශරීරය උපයෝගි කොටගත හැකි බැව් පෙන්වීමටයි. (.........)

● ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන පිළිතුර** තෝරන්න.

**26.** වර්තමානයේ දෘශ්‍ය කලාව යනුවෙන් හඳුන්වන්නේ,
(1) ඇස මූල්කරගෙන, දැකීමට සලස්වන නිර්මාණයන් වේ.
(2) ද්‍රව්‍ය මාධ්‍ය ඇසුරෙන් ගොඩනගා, කරනු ලබන නිර්මාණයි.
(3) ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පැවත ආ චිත්‍ර කලාවයි.
(4) වර්ණ මාධ්‍යයෙන් කරනු ලබන ආකර්ශණීය ප්‍රකාශනයි.
(5) චිත්‍ර, මූර්ති, ගෘහනිර්මාණ යන කලා අංගයන්ගේ එකතුවයි. (.........)

**27.** වාණිජමය ග්‍රැෆික් නිර්මාණකරණයේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ,
(1) නිෂ්පාදන අලෙවියේ දී වැඩි ප්‍රතිලාභයක් ලබාදීමයි.
(2) මුද්‍රණ කටයුතු වඩාත් කාර්යක්ෂමව හා ක්‍රමවත්ව කරගැනීමට හැකිවීමයි.
(3) නිෂ්පාදන නාමය වඩාත් ඉස්මතු වන පරිදි සන්නිවේදනය කිරීමයි.
(4) නිෂ්පාදන හා සේවා පිළිබඳව ඍජුව හා වක්‍රව සන්නිවේදනය කිරීමයි.
(5) නිෂ්පාදනයට අවශ්‍ය ලේබල හා ඇසුරුම් නිර්මාණය කර ගැනීමයි. (.........)

**28.** මෝගල් චිත්‍ර කලාව,
(1) ජෙහාන්ගීර් විසින් ඉන්දියාවට හඳුන්වාදෙන ලද ක්ෂුද්‍ර චිත්‍ර සම්ප්‍රදායයි.
(2) අවුරන්ගසේබ් විසින් ඉන්දියාව පුරා ව්‍යාප්ත කරන ලද්දකි.
(3) පර්සියන් ආභාසය මත ඉස්ලාමීය පාලකයින් විසින් ප්‍රචලිත කරන ලද්දකි.
(4) ඉන්දීය සාහිත්‍යයේ එන සිද්ධි නිරූපණය කිරීමට යොදාගත් චිත්‍ර සම්ප්‍රදායයි.
(5) ඉස්ලාම් භක්තිකයින් විසින් හඳුන්වා දෙන ලද ආගමික චිත්‍ර සම්ප්‍රදායයි. (.........)

**29.** ඝනිකවාදී කලාකරුවන්ගේ අරමුණ වූයේ,
(1) වස්තුවක් දෙස බලන කෝණය වෙනස් කිරීමයි.
(2) දෘශ්‍ය අරමුණු පවතින අයුරින්ම අනුකරණය කිරීමයි.
(3) යථාර්ථවාදී නොවන කලාත්මක රීතීන් අනුගමනය කිරීමයි.
(4) වස්තූන් ජ්‍යාමිතික හැඩතල ඇසුරෙන් විග්‍රහ කිරීමයි.
(5) සොබාදහමේ ඇති වස්තූන් නිශ්චල ස්වරූපයෙන් දැක්වීමයි. (.........)

**30.** ඊජිප්තු වාස්තු විද්‍යාවට මූලික පදනම වූයේ,
(1) පාරාවෝවරුන් වෙනුවෙන් ලෞකික ගොඩනැගිලි සෑදීමේ අවශ්‍යතාවයි.
(2) මරණින් මතු ආත්මයේ පැවැත්ම සඳහා වූ ඇදහිලි පද්ධතියයි.
(3) මළවුන්ගේ මෘත ශරීර තැන්පත් කර තැබීමේ අවශ්‍යතාවයි.
(4) පාරාවෝවරුන්ගේ බල පරාක්‍රමය දැක්වීමට ගත් උත්සාහයයි.
(5) පාරාවෝවරුන්ගේ ජීවිතය පිළිබඳ සිහිවටන තැබීමේ උවමනාවයි. (.........)

● ප්‍රශ්න අංක **31** සිට **35** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** ඊට ඉදිරියෙන් දී ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් තෝරන්න.

**31.** ගල් පවුරකින් ආවරණය වූ මෙම බෝධිඝරය පිහිටා ඇත්තේ,



(1) පඬුවස්නුවර ය.
(2) පඩිකෙම්ගල ය.
(3) නිල්ලක්ගම ය.
(4) හත්තිකුච්ඡි විහාරයේ ය.
(5) ලාහුගල මගුල් මහා විහාරයේ ය. (.........)

**32.** අනුරාධපුර යුගයේ ඉදි වූ මෙම ගොඩනැගිල්ල,



(1) මහමෙව්නා උයනේ පිහිටි උපෝසථඝරයයි.
(2) ගල්කණු සමූහයක් මත ඉදිකළ ප්‍රාසාදයකි.
(3) දුටුගැමුණු රජු විසින් කරවන ලද සන්නිපාත ශාලාවකි.
(4) ගල්කණු මත තැනූ රාජකීය මන්දිරයකි.
(5) භික්ෂූන් වහන්සේලා සඳහා ඉදිවූ නව මහල් ප්‍රාසාදයකි. (.........)


**33.** දැනට නටඹුන් වී ඇති මෙම වාස්තු විද්‍යා නිර්මාණය,



(1) අනුරාධපුරයේ විජයබාහු රජ මාලිගයයි.
(2) පොළොන්නරුවේ විජයබාහු රජ මාලිගයයි.
(3) පරාක්‍රම සමුද්‍රය අසල පිහිටි නිශ්ශංකමල්ල රජ මාලිගයයි.
(4) පොළොන්නරුවේ ලංකාතිලක පිළිමගෙයයි.
(5) පරාක්‍රමබාහු රජුගේ මාළිගය වූ විජයොත්පායයි.

(………)


**34.** මෙම ටාජ්මහල් මන්දිරය,



(1) මෝගල් පාලන සමයේ ඉදිකළ ප්‍රාසාදයකි.
(2) අග්‍රා නගරයේ ඉදිවූ ආගමික ස්මාරකයකි.
(3) මෝගල් සමයේ කිරිගරුඬ පාෂාණයෙන් කළ මන්දිරයකි.
(4) හුමායන් රජ සිහිවීම පිණිස ඉදිකළ ගොඩනැගිල්ලකි.
(5) ගෝලාකාර ශිඛර සහිත ඉස්ලාමීය මන්දිරයකි.

(………)

**35.** දැනට ශේෂ වී පවත්නා මෙම කොලෝසියම් ගොඩනැගිල්ල,



(1) විවෘත රඟමඩල පිළිබඳ සංකල්පයේ ආරම්භක අවස්ථාවයි.
(2) ග්‍රීක සම්භාව්‍ය ගෘහනිර්මාණ ආකෘතියකට අනුව ඉදිවූවකි.
(3) රෝමවරුන්ගේ බලය පිළිබඳ ප්‍රකාශනයක් වූ රාජකීය ගොඩනැගිල්ලකි.
(4) රෝමවරුන්ගේ යුධ ජයග්‍රහණ සිහිපත් කරන දැවැන්ත ඉදිකිරීමකි.
(5) රෝම නගරයේ ඉදිවූ ඕවලාකාර සැලැස්මකින් යුතු රඟමඩලකි.

(………)

● ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන පිළිතුර** පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



**36.** මෙම සිතුවම දක්නට ලැබෙන්නේ,
(1) තෙල්වත්ත රජමහ විහාරයේ ය.
(2) දඹුල්ල ලෙන් විහාරයේ ය.
(3) කතළුව පූර්වාරාමයේ ය.
(4) මුල්කිරිගල රජමහ විහාරයේ ය.
(5) කරගම්පිටිය සුබෝධාරාමයේ ය.

(………)

[අටවැනි පිටුව බලන්න.

**37.** මෙම සිතුවමට වස්තු විෂය වී ඇත්තේ,
(1) බෞද්ධ පෙරහැරක දර්ශනයකි.
(2) නැටුම්, ගැයුම් ඉදිරිපත් කරන ශිල්පීන් පිරිසකි.
(3) තේලපත්ත ජාතකයෙහි එක් අවස්ථාවකි.
(4) වෙස්සන්තර ජාතකයෙහි ඇතුළත් සිදුවීමකි.
(5) විහාරස්ථානයක තේවාව පවත්වන ආකාරයයි. (.........)

**38.** මෙම සිතුවමෙහි ශෛලිය අනුව එය අයත් වන්නේ,
(1) පොළොන්නරු යුගයේ අගභාගයේ දී අභාවයට ගිය චිත්‍ර සම්ප්‍රදායකට ය.
(2) දහනව වැනි සියවසේ මුල් භාගයේ දී බිහි වූ පහතරට සිතුවම් සම්ප්‍රදායට ය.
(3) උඩරට රාජධානිය බිඳවැටීමෙන් පසු ඇති වූ ජනකලා සම්ප්‍රදායකට ය.
(4) දහඅට වැනි සියවසේ අග භාගයේ දී බිහි වූ මධ්‍යම මහනුවර සම්ප්‍රදායට ය.
(5) මහනුවර රාජධානි සමයේ පැවති ප්‍රාදේශීය ශෛලියකට ය. (.........)

**39.** මෙම සිතුවමෙහි,
(1) චලන ඉරියව් සාම්ප්‍රදායික ලක්ෂණ අනුව තලය මත ගොනු කිරීමට උත්සාහ කර ඇත.
(2) රූප එකිනෙක ගැළපීමේ දී චලනය හා ක්‍රියාකාරිත්වය අතිශෝක්තියෙන් දක්වා ඇත.
(3) සංරචනමය උපක්‍රමයක් ලෙස කාන්තා රූප කවාකාර ආකෘතියකින් ගොනුකර ඇත.
(4) රිද්මයානුකූල ගලායාම මගින් සංරචනයේ ජීව ගුණය වඩාත් ඉස්මතු වී ඇත.
(5) පාර්ශවදර්ශී මානව රූප සංයමයෙන් යුතුව තලය මත හසුරුවා ඇත. (.........)

**40.** මෙම සිතුවමෙහි දිස්වන විශේෂ ලක්ෂණයක් වන්නේ,
(1) තාරුණ්‍යයේ ලාලිත්‍යමය ගුණය මනාව චිත්‍රමය භාෂාවකට ගොනු කර තිබීමයි.
(2) ශ්‍රවණේන්ද්‍රිය ආකර්ෂණය කරගැනීමේ ආදීනව පෙන්වීමට උත්සාහ දැරීමයි.
(3) නාටිකාංගනාවන්ගේ ක්‍රියාකාරී ඉරියව්වල ජීවී ස්වභාවය පෙන්නුම් කර තිබීමයි.
(4) රඟන වයන ක්‍රියාකාරී ඉරියව් මගින් නාට්‍යෝචිත අවස්ථාවක් නිරූපණය කර දැක්වීමයි.
(5) ශෘංගාරය කැටි වූ කාන්තා රූපවල ජීවී ගුණය ගෙනහැර දැක්වීමට උත්සාහ කිරීමයි. (.........)

* *

More Past Papers at
tamilguru.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

## II කොටස

* මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
* '**අ**' කොටසින් ප්‍රශ්න දෙකක් හා '**ආ**' සහ '**ඉ**' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

### 'අ' කොටස

### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

**1.** අනුරාධපුර යුගයේ පැවති බිතු සිතුවම් සම්ප්‍රදාය පොළොන්නරු යුගය අවසානය දක්වාම ක්‍රමිකව විකාශනය වෙමින් පැවත ආ බවට සාක්ෂි තිබේ.

(i) හිඳගල ලෙන් විහාරයේ පැරණි බිතු සිතුවම් අතරින් ශේෂ වී තිබූ බිතු සිතුවම් කොටස සඳහා යොදාගෙන ඇති තේමා **දෙක** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) සීගිරි බිතු සිතුවම් අතර කාන්තා රූපය විවිධත්වයෙන් යුතුව චිත්‍රණය කර ඇති ආකාරය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) පොළොන්නරුව තිවංක පිළිමගෙයි පැරණි චිත්‍ර හා මහියංගන ධාතු ගර්භයේ සිතුවම් පිළිබඳව සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 8 යි.)

**2.** පොළොන්නරු යුගයේ බෞද්ධාගමික ගොඩනැගිලි ඉදිකිරීමේ දී එක්වූ හින්දු ආගමික වාස්තු විද්‍යා ලක්ෂණ ගම්පොළ සහ මහනුවර යුගවලදී ද එලෙසින්ම දක්නට ලැබිණ.

(i) පොළොන්නරු යුගයේ දී ගෙඩිගේ සම්ප්‍රදායට අනුව ගඩොළින් ඉදිවූ බෞද්ධාගමික වාස්තු විද්‍යා නිර්මාණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) අංක 2 ශිව දේවාලයේ දක්නට ලැබෙන හින්දු ආගමික වාස්තු විද්‍යා ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) ගම්පොළ යුගයේ ඉදිවූ ගඩලාදෙනිය විහාරයෙහි හින්දු වාස්තු විද්‍යා ලක්ෂණ බෞද්ධාගමික මුහුණුවරකින් යොදාගෙන ඇති ආකාරය පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 8 යි.)

**3.** යුරෝපයේ නූතනවාදී කලා ප්‍රවණතා ගුරුකොට ගනිමින්, විසිවැනි සියවස මැද භාගයේ බිහි වූ ශ්‍රී ලාංකීය චිත්‍ර හා මූර්ති ශිල්පීන් විසින් යුග මෙහෙවරක් ඉටු කරනු ලැබ ඇත.

(i) නූතනවාදී මූර්ති කලාවේ ශිල්ප ක්‍රම භාවිත කරමින් තිස්ස රණසිංහ විසින් නිම කරන ලද මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) ස්ටැන්ලි අබේසිංහ චිත්‍ර ශිල්පියාගේ සිතුවම් ශෛලිය පිළිබඳව ඔහුගේ කෘති ඇසුරු කරගනිමින් කෙටි ඇගයීමක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) 43 කණ්ඩායමේ ප්‍රමුඛතම චිත්‍ර ශිල්පියෙකු වූ අයිවන් පීරිස්ගේ 'ආපසු ඒම' සහ 'ගල්කිස්ස' යන සිතුවම් ඇසුරින් ඔහුගේ කෘතීන්හි දිස්වන බටහිර නූතන චිත්‍ර කලා ප්‍රවණතා පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 8 යි.)

[දහවැනි පිටුව බලන්න.

## 'ආ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

**4.** මෞර්ය වංශික ධර්මාශෝක රජුගේ පාලන සමයේදී ආරම්භ වූ බෞද්ධ කලා සම්ප්‍රදාය ගුප්ත යුගය අවසානය දක්වා පැවතියේ ය.

(i) අශෝක ස්ථම්භ **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) සාංචි ස්තූපයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව කෙටි පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) "අජන්තා බිතු සිතුවම් අතර ථෙරවාදී සහ මහායාන සම්ප්‍රදායන් දෙකටම අයත් සිතුවම් දක්නට ලැබේ." සංසන්දනාත්මකව විමසන්න. (ලකුණු 8 යි.)

**5.** ඉන්දීය බෞද්ධ කලා සම්ප්‍රදායන් අතර ප්‍රතිමා නිර්මාණකරණයේ වෙනස්කම් රැසක් දක්නට ලැබේ.

(i) ගාන්ධාර කලා සම්ප්‍රදායට අනුව නිම කළ පිළිම **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) මථුරා සම්ප්‍රදායට අයත් කත්‍රා බුදු පිළිමය ගැන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) ගුප්ත යුගයට අයත් මථුරා බුදු පිළිමයේත් සාරනාත් බුදු පිළිමයේත් දක්නට ලැබෙන කලා ලක්ෂණ සංසන්දනාත්මකව විග්‍රහ කරන්න. (ලකුණු 8 යි.)

## 'ඉ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

**6.** 'අධියථාර්ථවාදය' (surrealism) යනු විසිවැනි සියවසේ චිත්‍ර කලාව නව මගකට යොමු කළ ප්‍රවණතාවකි.

(i) අධියථාර්ථවාදී චිත්‍ර ශිල්පීන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) අධියථාර්ථවාදී කලාවේ මූලික ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) අධියථාර්ථවාදය, යථාර්ථවාදී කලාවෙන් මෙන්ම වියුක්ත කලාවෙන් ද වෙනස් වන ආකාරය 'නොමියෙන මතකය' චිත්‍රය ඇසුරින් විමසන්න. (ලකුණු 8 යි.)

**7.** පුරාතන සමයේ බලවත් රාජධානියක් වූ ඊජිප්තුවේ කලා කෘතිවල ඔවුනටම අනන්‍ය වූ සාම්ප්‍රදායික ලක්ෂණ බහුලව දක්නට ලැබිණි.

(i) සාම්ප්‍රදායික ලක්ෂණවලින් සමන්විත ඊජිප්තු මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) ඊජිප්තුවේ මූර්ති තුළ දක්නට ලැබෙන සාම්ප්‍රදායික ලක්ෂණ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) සාම්ප්‍රදායික ඊජිප්තු චිත්‍ර කලා ලක්ෂණවලට අනුව 'නාටිකාංගනාවෝ සහ සංගීතඥයෝ' නමැති සිතුවම සුවිශේෂී නිර්මාණයකි. ඒ බව 'කුරුලු දඩයම' සිතුවම සමග සංසන්දනය කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 8 යි.)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

චිත්‍ර කලාව II
சித்திரக்கலை II
Art II

51 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් අධ්‍යයනය කිරීම සඳහා යොදාගන්න.**

**උපදෙස්:**

- ඔබේ **විභාග අංකය**, ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලි ව ලියන්න.
- ඔබ වෙත සපයා ඇති විශේෂ **ඇඳීමේ කඩදාසිය** (Drawing paper) වර්ණ චිත්‍රය ඇඳීම සඳහා භාවිත කරන්න. වෙනත් කිසිම චිත්‍රයක් හෝ අධ්‍යයන සටහනක් ඇඳීම අවශ්‍ය නොවේ.
- ඔබගේ චිත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය සම්පූර්ණයෙන්ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසිදායක විය හැකි ය.

## ස්වභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය

පහත සඳහන් උපදෙස් සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය ඇඳ, වර්ණ කරන්න.

* කඩදාසියේ තලය, අර්ථවත් ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.

* ද්‍රව්‍යයන්ගේ ගතිලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳ ව සැලකිලිමත් වන්න.

* ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ, ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.

* වර්ණ මාධ්‍යය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත් ව භාවිත කරන්න.

* ද්‍රව්‍ය සමූහයට ගැළපෙන පරිදි වර්ණවත් පසුබිමක් යොදන්න.

* ද්‍රව්‍ය සමූහය තබා ඇති ධාරකයේ (ලෑල්ලේ) පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැළපෙන පරිදි වෙනස් කරගැනීමට හැකි ය.

* දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මාධ්‍ය කිහිපයක් මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.

* * *

More Past Papers at
tamilguru.lk

12963

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

චිත්‍ර කලාව III
சித்திரம் III
Art III

51 S III

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** හා තෝරාගත් **ප්‍රශ්න අංකය** ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලි ව ලියන්න.
* දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මෙම මාධ්‍යයන් කිහිපයක් මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.
* අවශ්‍ය අයට විෂු කඩදාසි සපයනු ලැබේ.
* චිත්‍රය භාර දෙන විට, එය සම්පූර්ණයෙන්ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසිදායක විය හැකි ය.

● පහත සඳහන් **'අ', 'ආ'** සහ **'ඉ'** යන කොටස් තුන අතුරෙන් **එක්** මාතෘකාවක් පමණක් තෝරාගෙන, වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. මුහුදේදී කුණාටු සහිත දැඩි රළ පහරකට හසු වූ ධීවරයින් සහිත යාත්‍රාවක්
2. රාත්‍රී ආගමික පෙරහැරක දසුනක්
3. රෝහලක බාහිර රෝගී ප්‍රතිකාර අංශයක අවස්ථාවක්
4. වැව් තාවුල්ලකට පැමිණි වන සතුන් නරඹන දෙස්, විදෙස් සංචාරකයෝ

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

5. රෙදිපිළි මත මුද්‍රණය කිරීම සඳහා යොදාගත හැකි ව්‍යාප්ත මෝස්තරයක $9'' \times 9''$ ප්‍රමාණයේ කොටසක් වියුක්ත සත්ත්ව හැඩ ඇසුරෙන් නිර්මාණය කරන්න.
6. විදේශීය සංචාරකයින්ට අළෙවි කිරීම අරමුණු කරගත් ශ්‍රී ලාංකීය අනන්‍යතාව රැකෙන පරිදි නිර්මිත, බෑගයක මුහුණත අලංකරණයට සුදුසු විචිත්‍රවත් මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.
7. පාරිසරික සුන්දරත්වය ගෘහ අභ්‍යන්තරයට එක් කරගැනීම සඳහා $5' \times 10'$ ප්‍රමාණයේ අවකාශයට සුදුසු බිතු කැටයම් සැලැස්මක් පරිමාණයට අනුකූලව ඇඳ උචිත පරිදි වර්ණ ගන්වන්න.

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

8. සෞඛ්‍ය උපදෙස් පිළිපැදීම මගින් කොරෝනා වෛරසය පැරදවිය හැකි බවට සමාජය දැනුවත් කිරීමේ අරමුණින් අර්ථවත්, විචිත්‍රවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
9. '2050 අඟහරු ලොව' යන මැයෙන් ප්‍රබන්ධිත නව කථාවකට පිටකවරයක් ඇඳ, වර්ණ කරන්න. (මුල් පිටුව, සනකම (spine) හා පසු පිටුව අඩංගු විය යුතු ය.)
10. කාන්තාවන් සඳහා නිෂ්පාදිත දේශීය ශාකසාර මුසු වූ කේශාලේපයක් අඩංගු බෝතලයක් සඳහා ජාත්‍යන්තර වෙළඳපොළට උචිත ආකාරයේ ඇසුරුමක් සැලසුම් කර වර්ණ කරන්න.

* * *